22110267

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1**

Wednesday 11 May 2011 (morning)
Mercredi 11 mai 2011 (matin)
Miércoles 11 de mayo de 2011 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.





© International Baccalaureate Organization 2011

https://xtremepape.rs/

පහත දැක්වෙන ඡේද අතුරෙන් **එකක්** සඳහා විවරණයක් සපයන්න.

**1.**

මම නැගිට ගොස් කාමරය තුළට එබී බැලුවෙමි. තාත්තා කොහේ හෝ යන්නට ලෑස්ති වන බව මට පෙනිණ. මම ඔහුට නොපෙනෙන සේ බලා ඉන්නට වීමි. හිස පීරීම අවසන් කළ තාත්තා ඉක්බිතිව අල්මාරිය හැර එහි උඩ තට්ටුවෙහි වූ පර්ස් එක ගෙන කෝට් සාක්කුවෙහි දමා ගත්තේය. මම තාත්තාගේ හැම ඉරියව්වක් දෙසම හොඳින් බලා උනිමි.

තාත්තා තරහ වී පිට වී යනු ඇතැයි මට හදිසියේ ම සිතිණ. මගේ හදවත බියෙන් ගැහෙන්නට විය. නැවතත් අල්මාරිය අසලට පැමිණී තාත්තා කුඩයත් රැගෙන දොට්ට බැස්සේය. මම වහා ඔහු පසු පස්සේ දිව්වෙමි. තරප්පු පේළියෙන් බැස්ස තාත්තා කඩුල්ල තෙක් යනතුරු මම උඩ මිදුල අසලට පැමිණ බලා සිටියෙමි. නො අනුමානව ම තාත්තා තරහ වී පිට වී යනු ඇතැයි මට සිතිණ. "තාත්තා කොහේද යන්නෙ?"යි කෑ ගසා ඇසීමට මම සිතුවෙමි. මගේ හදවතෙහි ගැස්ම තවත් වැඩි විය. තාත්තා වැට අසලින් හැරෙත් ම මම කඩුල්ල අසලට දිවගෙන ගියෙමි. "තාත්තා කොහේද යන්නෙ?"යි මම කෑ ගසා ඇසුවෙමි. තාත්තා එය නෑසුනාක් මෙන් ගියේ ය. මගේ පපුව හිරවීමට යන්නා සේ මට දැනිණ. මම වහා කඩුල්ල අසලට දුවගෙන ගියෙමි. 'අනේ තාත්තේ යන්න එපා'යි කෑ ගසා කීමට මට සිත්විය. වංගුව අසලින් තාත්තා නොපෙනී යන තුරු ද මම ඇසිපිය නොහෙළා බලා සිටියෙමි. මම ගේ තුළට දුවගෙන ගියෙමි. තාත්තා තරහ වී යන බව අම්මා සමග කිය යුතු යයි මට සිතිණ. මම අම්මා නිදා සිටි ඇඳ ළඟට ගියෙමි. ඈ පියාගත් දෙනෙතින් යුතුව බිත්තිය දෙසට හැරී සිටියා ය.

මම යළිත් කඩුල්ල අසලට දුවගෙන ගියෙමි. ඉක්බිතිව කඩුල්ලෙන් පැන පාර දෙසට ද දුවගොස් බැලුවෙමි. තාත්තා ගැන සලකුණකුදු මට දක්නට නො විය. මම එසේ බොහෝ වේලා පාරේ දෙපැත්ත දෙස බලාගෙන උනිමි. පැලවත්තේ ලොකු මහත්තයා පාර දිගේ එනු මම දුටුවෙමි. ඔහුගෙන් තාත්තා ගියේ කොයි අතට දැයි යන්න දැනගත හැකි වෙතියි මට සිතිණ. ඇතැම් විටක තාත්තා ඔහුට තමා යන තැන ගැන ද කියන්නට ඇත. ලොකු මහත්තයා කඩුල්ල අසලට පැමිණී විගස මම ඔහුගෙන් තාත්තා ගැන ඇසුවෙමි. "තාත්තා එන කොට හම්බු වුනාද?"යි මම ඔහුගෙන් ඇසුවෙමි. "නැහැ, මන් මේ පහල පැත්තෙ ඉඳල එන ගමන්. ඒ පැත්තට යනව නම් හම්බු වුනේ නැහැ"යි ඔහු පිළිතුරු දුන්නේය.

මම ආපසු පැමිණ තරප්පි පඩියක් මත වාඩි වී පාර දෙස බලා ඉන්නට වීමි. මෙතෙක් පැවති අව්ව නැති වීම නිසා කඳු අතරත් ස්කෝලවත්තෙහිත් වූ පාළු ගතිය තවත් දියුණු වූවාක් සේ දැනෙයි. පාරෙහි අවට කිසිවකු පෙනෙන්නට නැත. ස්කෝලවත්තෙහි පහල කෑල්ලට ඇදුණු හරකෙක් එහි වූ එළවළු පාත්ති පොඩි කරමින් ඇවිද්දේ ය. නැගිට ගොස් ඌ එළවීමට මට නොසිතිණ. මම ළතැවිල්ලෙන් යුතුව පාර දෙස බලා සිටින්නට වීමි. අවට දෙස බලත්ම, තාත්තා තරහ වී පිට වී යන්නට ඇතැයි යන හැඟුම මගේ සිත තව තවත් වෙළා ගනියි. උන් තැනින් නැගිට ඒ මේ අත යාමට තරම් වත් පණ ගතියක් නැතුවා සේ මට දැනෙයි.

එසේ බොහෝ වේලා පාර දෙස බලා සිටි මම නැගිට අම්මා නිදා උන් කාමරයට යළිත් ගියෙමි. අම්මා තවමත් පෙර ලෙස ම බිත්තිය දෙසට හැර වූ මුහුණින් යුතුව නිදි යයි.

ගුණදාස අමරසේකර, ජීවන සුවඳ, 1956

- මෙම කොටසෙන් නිරූපණය කර ඇති අවස්ථාව පිළිබඳ අදහස් දක්වන්න. ඔබ සිතන පරිදි එම සිදුවීමට කෙබඳු පසුබිමක් හේතු වන්නට ඇද්ද?

- මෙහි දක්වා ඇති පරිදි පියා නිවසින් පිට වී යාම ගැන දරුවාගේ සිත තුළ පහළ වන සිතිවිලි කෙබඳුදැයි විස්තර කරන්න.

- මවගේ සහ පියාගේ හැසිරීම පාඨක සිත් තුළ කුතුහලය දනවන ලෙස ඉදිරිපත් කිරීමට කතුවරයා උත්සාහ ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

- ළමා මනස හා සිතුම් පැතුම් හොඳින් නිරූපණය වන සේ මෙහි භාෂාව කොතෙක් දුරට සාර්ථක ලෙස යොදාගෙන ඇද්ද?



https://xtremepape.rs/

**2.**

## කුරුළු ජීවිතය

යමු යමු සොඳුර රන් වන් හිරු එළිය සි     ප
රජදානකට ඉගිලී යමු අපට කැ     ප
වන දෙව් ලොවේ වළඳන්නට සියලු සැ     ප
ලස්සන කැදැල්ලක් බැඳගත යුතුය අ     ප

නිවහල් දිවි පෙවෙත අරඹා වනවා     සී
නැළවෙමු මිනිස් කටහඬ කණකට නෑ     සී
සපයා පුළුන් වැටි, පරඬැල් පෙඳ පා     සී
ගෙය ගොඩනැඟුම මහ වනයෙහිමය ලේ     සී

ළංවිය නොහී ජනපදවල කුණු කස     ල
සුව ජනකව පෙනේ මිටියාවත නිස     ල
අපි නිදහසේ හැසිරෙමු ඇළ දොළ අස     ල
අපටත් සොඳුර සෑහෙයි අප සතු කුස     ල

මේ පරිසරය තුළ සැප පහසුවට හි     ත
දිවි පෙවෙතකට අග හිඟ කිසිවකුදු නැ     ත
ගී ගයමින් නටන්නට අතු රිකිලි ම     ත
හැම දං පඳුරක්ම මෙහි අප නමට ඇ     ත

කොළ පැහැ බිතු පියසි නොපෙනෙන පරිදි කැ     පී
නොගලන පරිදි සිරිකඩ වැහි සුලඟ කි     පී
රැකවල් තැබිය හැකි වන සේ ළපලු පි     පී
රුක් මුදුනකම කුඩුව බැඳගනිමු අ     පී

පෙම්බර කිරිල්ලිය එළියට නොබැස සි     ට
පසුවන අවදියට උණුසුම් සුවය පි     ට
රසවත් දං හිඹුටු තනියම එකතු කො     ට
දොර විවරයෙන් ගෙනැවිත් දිය හැකිය ම     ට

සුළඟේ පියාපත් පිරිමැද සුවඳ ක     වා
රන්වන් වලා රැළි කටහඬ කැටුව ය     වා
අහසේ ඈත ඉගිලී ගොස් උදය හ     වා
යුග ගී ගයමු දැන් අපි රස පවස නි     වා

**(එච්. එම්. කුඩලිගම) - පද්‍යාවලි,** 1952

– කවර තේමාවක් පාදක කරගෙන මෙම කවි පෙළ රචනා වී ඇද්ද?

– කුරුළු ලෝකය තුළ පවත්නා ආදරය මෙහිදී කවියා කොතරම් ප්‍රබල ලෙස නිරූපණය කර තිබේද?

– වනගත පරිසරයේ කුරුළු ජීවිතය කවියා ඉදිරිපත් කර ඇත්තේ කෙසේද. එම ජීවිතය මිනිස් ජීවිතය සමග කවර ආකාරයෙන් සන්සන්දනය කර තිබේද?

– "සුන්දර වනගත පරිසරයක් නිරූපණය කිරීමට කවියා යොදාගෙන ඇති භාෂාව බෙහෙවින් සාර්ථක වී ඇත." මේ ගැන අදහස් දක්වන්න.



https://xtremepape.rs/